# ගම්පහ අධ්‍යාපන කලාපය

## අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2020
## සිංහල භාෂාව හා සාහිත්‍යය II

**කාලය පැය 02 යි.** **11 ශ්‍රේණිය**

(1) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු ලබානොදන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

1. පහත දැක්වෙන අක්ෂර කුමන ස්වර වර්ගයකට අයත් දැයි නම් කරන්න.
   (අ) (අ)ඃ, ශ, ෂ, ස, හ, ෆ
   (ආ) ව, ෆ

2. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
   නිර්මාණයක භාෂාව භාවිත ගුණයෙන් යුතු විම අනිවාර්‍ය බවත්, සාහිත්‍යයික භාෂාව ධ්වනි පූර්ණ විය යුතු බවත් මතයකි.

3. පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.
   (අ) අමාත්‍ය + අංශය (අ) ඉනි + අල

4. "ආකාශයෙහි පිපි වැනි ගිය තරුකැලයක් සේ පිරිවරා සිටිනා රහත් පෙළකින් හා පුන් සඳු සේ දිලිසෙන ස්වාමිදරුවන්ගේ ශ්‍රී විභූතී දැක...."
   ඉහත ප්‍රකාශයෙහි දැක්වෙන උපමා හා රූපක ලියා දක්වන්න

| | උපමා | රූපක |
|---|---|---|
| (i) | .............................................................. | .............................................................. |
| (ii) | .............................................................. | .............................................................. |

5. පහත දැක්වෙන චරිත ඇතුලත් කතා නම් කරන්න
   (i) සයිමන්
   (ii) රියෝහෙයි

6. පහත දැක්වෙන පද්‍ය නිර්මාණවල රචකයන් නම් කරන්න
   (i) මතකයට
   (ii) බෝඩිම

7. පහත වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න
   (i) මෙබදු අපරාධ කවුරු හෙළා නොදකිද?
   (ii) මම සින්දු කියද්දී ඈ අසා සිටියා ය.

8. පහත සඳහන් වාක්‍ය කර්මකාරයට හරවන්න
   (i) සොර මුළ ළමයෙකු පැහැර ගත්හ.
   (ii) හෙතෙම කතුරකින් කඩදාසි කොළ කැපුවේය.

9. පහත දැක්වෙන නවකතාවල රචකයන් නම් කරන්න
   (i) සඳු මෙලෙස පුර දෙරණේ
   (ii) සුනේත්‍රා

10. පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න
    (i) තණ්හාව නිසා කරදරයට වැටීම
    (ii) එක සමාන අය වීම

(2) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

අ) ශ්‍රී ලංකාව වැනි රටකට කෘෂිකර්මාන්තය නගා සිටුවීම රටේ සංවර්ධනයට අත්‍යවශ්‍ය අංගයකි. එසේ වුවද විවිධ පාරිසරික ගැටලු හා සතුන්ගෙන් සිදුවන හානි නිසා ගොවීන් දැඩි දුෂ්කරතාවලට මුහුණ පා තිබීම කෘෂි වගාව කඩා වැටීමට හේතු වී ඇත. දුෂ්කර ප්‍රදේශවල නිෂ්පාදන ධාරිතාවය වැඩි කර ගැනීමට ගොවීන්ට හා රජයට ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳ ඔබගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන්න. ඒ පිළිබඳ සාකච්ඡා කරන්න

ආ) මාර්ග අනතුරු ඉහළ යාම අද බහුලව සිදුවන ශෝචනීය තත්ත්වයකි. රියදුරන්ගේ තරගයක්, මහාමාර්ගවල ධාවනය වන රථ වාහන දිනෙන් දින වැඩිවීමක් මාර්ග නීති පිළිනොපැදීම ආදි හේතු මීට හේතු පාදක වන ප්‍රබල කරුණු කිහිපයකි. මේ පිළිබඳ රියදුරන්, පදිකයන් හා රජයක් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කරන්න.

ඉ) අන්තර් ජාතික මට්ටමින් සංවිධානය කෙරෙන ක්‍රීඩා නිසා මුළු ලොවම විශ්ව ගම්මානයක් බවට පත් ව ඇත. ක්‍රීඩාව තුළින් විනය ඇති කරවනවා පමණක් නොව අන්තර් ජාතික සබඳතා සඳහා ද මග පාදයි. මෙම ක්‍රීඩා සඳහා ශ්‍රී ලංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා ද කැපී පෙනෙන අයුරින් වැඩි වී ඇත. පාසල් වල හා ජාතික මට්ටමින් ක්‍රීඩාව වැඩි දියුණු කිරීම ජාතික මෙහෙවරකි.

ඊ) සෞන්දර්යාත්මක සිතුම් පැතුම් වලින් පිරිපුන් මිනිසා සමාජයට අගනා මෙහෙවරක් කරන්නෙකි. එවන් සෞන්දර්යාත්මක මනසක් ඇති කිරීමට නූතන ගීත වලට හැකි වේද යන්න ප්‍රබල ගැටලුවකි. හුදෙක් ශබ්ද රසයට මුල් තැන දෙමින් නිර්මිත ගීත වලින් සිදු වනුයේ අනර්ථයක්ම ය. මන්ද වත්මන් පරපුර රසවින්දනය කරනුයේ එම ගීත ම වීමයි. වර්තමානයේ මනස සුවපත් කරන සෞන්දර්යාත්මක ගීත අල්ප වශයෙන් හෝ බිහිවීම සතුටට කරුණකි. නිර්මාණාත්මක චින්තනය අවදි කරමින් සිසු පරපුර රසාලිප්ත ගීත සාහිත්‍යයකට මං පෙත් විවර කිරීමට කළහැකි යෝජනා සාකච්ඡා කරන්න.

(3) පහත දැක්වෙන පාඨය වචන 50 - 60 ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

මුල කෘතියට සාකල්‍යයෙන්ම සාම්‍ය පරිවර්තනයක් සැපයීම උගහට බව දැන් පොදුවේ පිළිගැනුණකි. එයට ප්‍රධාන හේතුව භාෂා දෙකක් අතර පූර්ණ අනුරූපතාවක් නොමැති වීමය. පූර්ණ පරිවර්තනය කිසිසෙත්ම සාධනීය කර්තව්‍යයක් නොවන බව විචාරකයන් අවධාරණය කරද්දී රෝමන් ජාකොබ්සන්, ඉයුජින් නයිදා, කතරිනා රයිස් ආදීන් නිදසුන් ගෙන හැර පාමින් පෙන්වා දුන්නේ පරිවර්තකයාගේ අපේක්ෂාව හා උත්සහය විය යුතුතේ මූලාශ්‍රයට හැකි තරම් සමීප සාම්‍යයක් ඉලක්ක කෘතියෙහි ඇති කිරීම බවය.

පරිවර්තනය සඳහා යොදා ගන්නා භාෂාව, එම භාෂක සමාජයට අයත් සංස්කෘතියේ පිළිබිඹුවකි. කිසියම් ජන කොට්ඨාසයක වෘත්තීන්, අභිචාර විධි, චාරිත්‍ර වාරිත්‍ර, උත්සව, ආගම්හා බද්ධ විශේෂිත යෙදුම් පරිවර්තකයාට ගැටලු ඇති කරයි.අපට පරිවර්තනයක් අවශ්‍ය වන්නේ මූලාශ්‍රය හැකි තරම් සමීපයෙන් වින්දනය කිරීමටය. චරිත, අවස්ථා, ප්‍රත්‍යාවේක්ෂණ ආදිය මුල් කතුවරයාගේ සිතෙහි හා හද ගැබෙහි තිබූ අයුරින් අප වෙතට සම්ප්‍රාප්ත විය යුතුය. සාහිත්‍ය කලා කෘතියක අර්ථය එක වාග් විද්‍යාත්මක සංකේත සංචිතයකින් වෙනත් වාග් විද්‍යාත්මක සංකේත සංචිතයකට පූර්ණ ලෙස මාරු කිරීමේ දී ප්‍රධාන කරුණු දෙකක් හරස් වේ. භාෂා දෙකක් හෝ සංස්කෘතින් දෙකක් හෝ එක සමාන නොවන නිසා මූලාශ්‍රයේ අර්ථ සාකල්‍යයම නැතත් එයින් සෑහෙන ප්‍රමාණයක් ජනනය කරන පරිවර්තනයකින් සෑහීමකට පත් වීමට සාහිත්‍ය රසිකයාට සිදු වේ.

(ලකුණු 10)

(4) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

සම්භාව්‍ය සිංහල ගද්‍ය සම්ප්‍රදායේ අවනතිය කෙරෙහි අනුරාධපුර යුගයේ සිට පැවති සොළී ආක්‍රමණ සෘජු බලපෑම් ඇති කළේය. පොළොන්නරු යුගයේ දී සිදු වූ නිකාය භේදය මෙන්ම විදේශීය ආක්‍රමණ සාහිත්‍යෝන්නතියට නොව අවනතියට හේතු විය. එපමණක් නොව සම්භාව්‍ය ගද්‍ය සම්ප්‍රදාය පිරිහියාමට එකල රචනා වූ කතෘ වල පිටපත් කිහිපයක් පමණක් පැවතීම, ස්වාභාවික විපත් මගින් පොත් පත් විනාශ වීම නිසාද ගද්‍ය කෘතිවල විනාශය සිදුවිය. එතෙක් සිංහල බසින් තිබූ පොතපත පාලියට නැගීම නිසාද සිංහල ගද්‍ය කෘති අභාවයට පත් විය. කෝට්ටේ යුගයේ පැවති ගද්‍ය සම්ප්‍රදායෙන් මිදී ස්වධීන නාට්‍ය මාර්ග කෙරෙහි යොමු වූහ. එම යුගය ගද්‍ය සාහිත්‍ය නොව පද්‍ය සාහිත්‍ය ප්‍රමුඛ කරගත් යුගයක් විය. සිව් පද සාහිත්‍යයේ බැබළීමට හේතු පාදක වූ සංදේශ කෘතින් රැසකගේ නිර්මාණය සිදුවන්නේ ද බුදුගුණ කවියෙන් කීම සිදුවන්නේ ද මෙම යුගයේදී වේ.

1. ගද්‍ය සම්ප්‍රදායේ අවනතියට සෘජුව බලපෑ හේතුව කුමක්ද?

2. පොළොන්නරු යුගද ගද්‍ය සාහිත්‍යයේ පිබිදීමක් ඇති වූ බව මෙම ඡේදයෙන් කියවේද
3. එම යුගයේ ගද්‍ය කෘතිවල විනාශයට බලපෑ හේතු දෙකක් ලියන්න.
4. කෝට්ටේ යුගයේ නිර්මාණවල ඇති වූ විශේෂත්වයක් ලියන්න.
5. බුදු ගුණ කවියෙන් කිම ආරම්භ වන්නේ කුමන යුගයේදී ද? (ලකුණු 10)

(5) පාසැල් හා ප්‍රජාව අතර සම්බන්ධතා පැවැත්වීම අධ්‍යයන ක්‍රියාවලිය සේම පාසැලක සිදු විය යුතු අනිවාර්ය අංගයකි. දුෂ්කර පාසැල් නගා සිටුවීමේ ප්‍රජා සත්කාරය අරමුණු කරගනිමින් ඇති දුෂ්කර ප්‍රදේශයක් වූ වැලිකන්ද කනිෂ්ඨ විද්‍යාලයේ සිසුන් 200කට පමණ පාසැල් උපකරණ, කාර්යාලීය උපකරණ හා පරිගණක යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමට විදුහල්පතිතුමියගේ අනුශාසකත්වය හා ප්‍රධානත්වය මත ශිෂ්‍ය නායක මණ්ඩලය තීරණය කෙරිණි. 2018.10.30 දින එම පරිත්‍යා සඳහා එම පාසලට පැමිණෙන බවත්, ඉහත පරිත්‍යාග සඳහා විශේෂයෙන් ඇතුළත් විය යුතු භාණ්ඩ ලැයිස්තුවක් ඇතොත් එය දන්වන ලෙසින් ඔබ පාසලේ විදුහල්පතිතුමිය, ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යාවන් 50 පමණ එදිනට සහභාගි වීමට තීරණය කොට ඇති බවත් දන්වමින් එම පාසලේ විදුහල්පතිතුමා වෙත යවන ලිපිය ලියන්න.

නැතහොත්

ඔබ වඩාත් සිත්ගත් කාලීන, අධ්‍යයන හෝ විශේෂ සිද්ධියක් ඇසුරු කරගෙන පුවත්පත් විශේෂාංගයක් සපයන්න. එය නිර්මාණාත්මක ගුණයෙන්ද යුක්ත විය යුතුය. (වචන 125 ක් පමණ සැහේ) (ලකුණු 15)